යුධ වැදීම නිර්දේශ කරන ඉස්ලාම් ධර්මය හැකි පමණ සාමය හා සමාදානයම අවධාරණය කරයි. එමෙන්ම තම ආගමික හෝ සංස්කෘතික අගයන් සැහැල්ලුවට සැලකීමෙන් මුස්ලිම්වරුන්ව ප්‍රවේශම් විය යුතු යැයිද ඉස්ලාමය අවවාද කරයි. ඉන්දියාව, ස්පාඤ්ඤය වැනි රටවල මුස්ලිම්වරුන්ගේ පාලනය තිබුණු වකවානුවලට එම රටවල් ආගමික සහජීවනයේ උද්‍යාන ලෙසින් පැවතුණේය. එවිට එම පාලනවල සිටි අන්‍ය ආගමිකයන් මුස්ලිම්වරුන් සමඟ අත්වැල් බැඳ ගනිමින් රාජ්‍ය පාලනය, අධ්‍යාපනය, සමාජ සංවර්ධනය ආදී ක්ෂේත්‍රවලට නොමසුරුව දායක වූහ. සමාජ සහජීවනය හරහා උන්නතිය ඇති කිරීම ඉස්ලාමයේ මග පෙන්වීමයි.

"අහස හා පොළොව මවා තිබීමද ඔබගේ භාෂාවන් හා (සමෙහි) වර්ණ විවිධාකාරයෙන් තිබීමද ඔහුගේ සාධක අතුරින් වේ. උගතුන්ට මෙහි නියත වශයෙන්ම සාධක ඇත". (අල්-කුර්ආන් 30:22)



# සහජීවනය පිළිබඳ ඉස්ලාමීය සංකල්පය

## විග්‍රහය

ඉවසීම යනු තමාට වඩා වෙනස් මත දරන්නන් වෙනස් ආකාරයට ක්‍රියාකරන්නන් මෙන්ම අනෙක් ආගම් හා ප්‍රදේශවලට අයත් පුද්ගලයන් විෂයෙහි සමානාත්මතාවයෙන් හා සාධාරණත්වයෙන් යුතුව ක්‍රියා කිරීමයි. මෙම ආකල්ප "අන්‍ය මත ඉවසීම" යැයි නිර්වචනය කළ හැක.

එමෙන්ම මෙය තමා ප්‍රිය නොකරන කටයුත්තක් හෝ යම් විෂයක් කෙරෙහි මධ්‍යස්ථභාවයෙන් යුක්තව කටයුතු කිරීම යනුවෙන්ද අරුත් ගැන්විය හැක.

සහජීවනයෙන් යුත් සාමකාමී පරිසරයක් යනු වෙනස් වූ මත දරන ජන කොටස් තම අනන්‍යතාවන් ආරක්ෂා කර ගනිමින් විවිධත්වය හේතුකොට ගෙන එකිනෙකා අතර ගැටුම් ඇති නොකර ගරුත්වයෙන් යුතුව සාමකාමීව ජීවත්වීම ලෙස විග්‍රහ කළ හැක. එනම් විවිධත්වය තුළ එකමුතුකම ගොඩ නැංවීම යනුවෙන් හැඳින්විය හැක.

මේ අනුව ඉවසීම හා සහජීවනය අතර සමීප සබඳතාවක් ඇත. සැබැවින්ම සහජීවනය සඳහා වන මූලික කොන්දේසිය වනුයේ ඉවසීමයි. සහජීවනය තිබෙන තැන සාමයද නියත වශයෙන්ම රැඳා පවතිනු ඇත. මිනිස් ජීවිතයේ මූලික අංගවලට මෙම ගුණාංග දෙක අයත් වේ. සමාජ, ආර්ථික, දේශපාලනික සහ ආගමික යන සෑම විෂයකටම මෙම ගුණාංග අත්‍යවශ්‍ය වේ. මෙම ගුණාංග කෙනෙක් තුළ පිහිටා තිබීම යනු ඔහු ශිෂ්ඨ මෙන්ම පුළුල් දැක්මක් ඇත්තෙකු බවට සාක්ෂියකි.

## ඉස්ලාමීය දැක්ම

ඉවසීම මෙන්ම සහජීවනය යන සංකල්පය ද ඉස්ලාම් ධර්මය තුළ මූලික ස්ථානයක් දරයි. පහතින් සඳහන් වන්නේ ඒ පිළිබඳව වූ කෙටි විවරණයකි.

## 01. විවිධත්වය විශ්ව නියමයක් ලෙස පිළිගැනීම

ඉවසීම සහ සහජීවනය පිළිබඳව මූලික අඩිතාලම ඉස්ලාමීය ඉගැන්වීම් තුල ගැබ්ව ඇත. මිනිස් වර්ගයාගේ පැවැත්මට විවිධත්වය අත්‍යවශ්‍ය යැයි ද එය දෙවිඳුන්ගේ (නිර්මාතෘන්ගේ) සැලස්මෙහිම වූ කොටසක් බවද ඉස්ලාමය පෙන්වා දෙයි. දෙවිඳුන් විවිධ වූ නිර්මාණයන් ජීවී අජීවී වශයෙන් මවා තිබෙන අතර ඒ සියල්ලට එකිනෙකාට ආවේනික වූ ක්‍රියාකාරකම් නියම කර ඇත.

මිනිසුන් අතර විවිධ වර්ණයන්ගෙන් යුත් විවිධ භාෂාවන්ගෙන් සහ නොයෙක් විවිධ ස්වරූපයන්ගෙන් ආකල්පයන්ගෙන් යුත් අය සිටිති. දෙවිඳුන් විසින් මෙසේ විවිධත්වයක් ගොඩ නැංවීමට හේතුව එකිනෙකා තුල ඇති විවිධත්වය මූලික කොට ගෙන ඔවුන් අතර උස් පහත් භේදයන් ඇති කිරීම හෝ එකිනෙකා අතර විරසකයන් ඇති කර කෝලාහල ගොඩ නැංවීම හෝ නොවේ.

විවිධ භාෂාවන් සහ මිනිසුන් තුල ඇති විවිධත්වය මැවුම් කරුවකු සිටින බව සනාථ කරවන සාධකයක් යැයි අල්ලාහ් (නිර්මාතෘන්) අප වෙත අවධාරණය කරයි. මෙම විවිධත්වයෙන් යුතු නිර්මාණයන් පිළිබඳව සිහි නුවණින් සිතා බලන මෙන් මිනිසුන් වන අප සියල්ලන්ටම අල්-කුර්ආනය ආරාධනා කරයි.

“අහස් ද මිහිතලය ද නිර්මාණය කර ඇත්තේ ද, නුඹගේ භාෂාවන්හි ද වර්ණයන්හි ද විවිධත්වය ඔහුගේ (අල්ලාහ්ගේ) සංඥාවන්ගෙන්ය. දැනුමැත්තන්ට නියත වශයෙන් ම එහි සාධකයන් ඇත. ” (අල්-කුර්ආන් 30:22)

එමෙන්ම මිනිසුන් අතර විවිධ වූ ගෝත්‍ර ඇතිකර ඇත්තේ ඔවුන් එකිනෙකා වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට බවද අවධාරණය කරයි.

“මනුෂ්‍යයිනි, සැබැවින්ම අපි ඔබව එක් පිරිමියෙක් හා එක් ස්ත්‍රියකගෙන් නිර්මාණය කළෙමු. කෙනෙකු අනෙකා හඳුනාගනු



## 08. ප්‍රතිසන්ධාන ක්‍රමෝපායන්

පාර්ශව දෙකක් අතර තිබුණු ගැටුම් අවසන් වුවහොත් ඔවුන් අතර ප්‍රතිසන්ධානයක් ඇති කිරීමට ක්‍රියා කරන මෙන් ඉස්ලාම් ධර්මය උපදෙස් කරයි. අන් පාර්ශවයක් අතින් අනෙක් පාර්ශවයට අයුක්තියක් සිදු වී තිබෙන බව සනාථ වුවහොත් අදාල පාර්ශවය අනෙක් පාර්ශවයෙන් සමාව අයැදිය යුතුය. අවශ්‍ය නම් හානි පූර්ණද ලබා දිය යුතු යැයි ඉස්ලාමය දෙසයි. එමෙන්ම වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමටද කටයුතු කළ යුතුය. මේ පිළිබඳ නබිවදනක මෙසේ සඳහන් වෙයි. “ඔබගේ සබඳතාවය සිඳ දමා සිටින්නන් සමඟද ඔබ සබඳතාවය පවත්වන්න. ඔබට නෙදෙන අයට ඔබ දෙන්න. ඔබට අයුක්තිය කළවුන්ට ඔබ සමාව දෙන්න.”

යහපත් විශ්වාසිකයන් වෙත තිබිය යුතු උදාර ගුණාංග ගැන ශුද්ධ කුර්ආනයේ මෙසේ සඳහන් වෙයි.

“නපුරට කුලිය එවැනිම වූ නපුරකි. එනමුත් (කෙනෙකුගෙන් නපුරට) සමාවී සාමාදාන වුවහොත් ඔහුගේ කුලිය අල්ලාහ් වෙත තිබේ. නියත වශයෙන්ම මෙයට පටහැනිව අපරාධ කරන්නන්ව ඔහු ප්‍රිය කරන්නේ නැත. (අල්-කුර්ආන් 42:40)

(යහපත් විශ්වාසිකයන්) මිනිසුන්ට සමාව දෙන්නන්ව සිටිනු ඇත. (අල්-කුර්ආන් 3:134)

තමාගේ සොහොයුරාගේ ආත්ම ගරුත්වය හෝ ඔහුට හිමි අන් කිසිවක් සම්බන්ධයෙන් කෙනෙකු අයුක්තියක් කර තිබුනේ නම් දිනාර් දිර්හම්වලින් කිසිදු ඵලක් නොමැති දිනය (එනම් පරමාන්ත දිනය) ඇති වන්නට පෙර එයින් නිදහස් වෙත්වා” යි මුහම්මද්තුමන් අවවාද කළහ.

සහජීවනය හා ඉවසීම දෙසන ඉස්ලාම් ධර්මය එයට අවශ්‍ය මගපෙන්වීමද ලබා දෙයි. අවසාන විකල්පයක් ලෙසින් පමණක්

පොදු කටයුතුවලදී මුස්ලිම්වරුන් අන් ජන කොටස් සමඟ එක්ව වැඩ කළහ. එසේ කරන මෙන් ශුද්ධ කුර්ආනයද නිර්දේශ කළේය. තවද යහපතටද බියබැති බවටද ඔබ එකිනෙකාට උපකාර වන්න පාපයෙහි හා භේදයෙහි ඔබ එකිනෙකාට උපකාරව නොසිටින්න. (අල්-කුර්ආන් 5:02)

මුහම්මද්තුමන් තරුණ වියෙහි සිටින විටම මෙවන් සමාජ සේවා ආකල්ප තිබුණි. මෙසේ මුස්ලිම්වරුන් අන් ජන කොටස් සමඟ සහජීවනයෙන් කටයුතු කළ අතරම ඔවුන් අයුක්ති සහගතව කටයුතු කිරීමට එරෙහිව සටන් කිරීමටද පසුබට වූයේ නැත. කොතෙකුත් අයුක්තියට හිස නමමින් සිටින්නට ඉස්ලාමය අවසර නොදෙයි. එමෙන්ම තමාගේ ආත්මාරක්ෂාවට තර්ජන එල්ල වන විට එය දිගින් දිගටම ඉවසා සිටින යුතු යැයි ඉස්ලාමය දෙසන්නේද නැත. එය ප්‍රායෝගික වන්නේද නැත.

## 07. සම්මිශ්‍රනය නොවී එක්ව වාසය කිරීම

අන් ජනකොටස් සමඟ එක්ව වාසය කළද තම අනන්‍යතාවන් රැක ගැනීම මුස්ලිම්වරුන්ගේ වගකීමකි. විශ්වාසයට අදාල ආගමික වතාවත්, සුවිශේෂී චර්යා, සිරිත් විරිත් ආදියෙහි කිසිදු අඩුවක් කරන්නට ඉස්ලාමය අනුමැතිය නොදෙයි. සහජීවනයේ නාමයෙන් මෙම අනන්‍යතාවන්ට හානි ඇති කර ගත නොයුතුය. පිළිමවලට වැඳීම, මිනිසුන්ට සිරස පහත් කිරීම, මුස්ලිම් ස්ත්‍රීන් අන්‍ය පුරුෂයන් ඉදිරියට හිජාබයෙන් ආවරණය නොවී සිටීම, අනුමැතිය නොමැති මාංශ හෝ ඉස්ලාමීය ක්‍රමයට ඝාතණය නොකරන ලද මාංශ අනුභව කිරීම වැනි දේ අන් අය සතුටු කිරීමට යැයි කියමින් කරන්නට මුස්ලිම්වරුන්ට අවසර නැත.

මේ අනුව අන් ජනකොටස් වලින් ඈත් වී සිටීම හා ඔවුන් සමග පමණට වඩා සම්මිශ්‍රණය වීම යන අන්ත දෙකටම නොගොස් මුස්ලිම්වරුන් මධ්‍යස්ථ පිලිවෙතක් අනුගමනය කළ යුතුය.



පිණිස ඔබ ජාතීන් හා ගෝත්‍රිකයින් වශයෙන් (පත්)කළෙමු. ඔබගෙන් කවුරුන් ඉතාමත් බිය භක්තිකයින් ව සිටින්නේද, ඔහු නියත වශයෙන්ම අල්ලාහ් අභියස ඉතා ගෞරවනීය තැනැත්තෙකි. සැබැවින්ම අල්ලාහ් සර්වඥය සර්වප්‍රාඥය." (අල් කුර්ආන් 49:13)

නිර්මාතෘන් විසින් මිනිසුන් වන අප වර්ණය, භාෂාව හා ගෝත්‍රය වැනි විවිධත්වයෙන් යුතුව නිර්මාණය කිරීමට පැහැදිලි අරමුණක් ඇති බව ඉහත වැකියන් තුලින් ගම්‍ය වේ.

සමේ වර්ණය මුල් කොටගෙන ඇති වූ විවිධ ගැටුම් සහ කල කෝලාහලවලදී මාර්ටින් ලුතර් කිං, නෙල්සන් මැන්ඩෙලා වැනි ලෝසුප්‍රකට පුද්ගලයින් පවා ඊට එරෙහිව සටන් කළහ.

ඉහත පෙන්වා දී ඇති අල්-කුර්ආන් වැකි පිළිබඳව මිනිසුන් අවධානය යොමු කරන්නේ නම් එවන් ගැටුම්කාරී අවස්ථා බොහෝමයක් අවම කර ගැනීමට හැකියාවන් පවතී. එම ඉගැන්වීම් තුල අපගේ ආකල්ප සංවර්ධනය කර ගන්නේ නම් අප රට තුල වසර 30ක් පැවති වර්ගවාදය මුල්කොට ගෙන ඇති වූ බෙදුම් වාදී ආයුධ සන්නද්ධ අරගලය පවා වලක්වා ගැනීමේ හැකියාවක් තිබුණි. මන්ද යත් ඉස්ලාමය මෙවැනි බෙදීම් සහ ක්‍රියාවන් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරයි.

“නුඹගේ පරමාධිපතිට අභිමත වූයේ නම් මිහිතලය මත සිටිනා සියල්ලන්ම විශ්වාසවන්තයින් වන්නට ඉඩ තිබිණ. එබැවින් මිනිසුන් (සියල්ල) විශ්වාසවන්තයින් වන ලෙස නුඹ (මුහම්මද් නබිතුමනි!) ඔවුන්ට බල කරන්නෙහිද?” (අල්-කුර්ආන් 10:99)

මේ අනුව මුස්ලිම්වරුන් තම ධර්මය අන් අයට ඉතා විනීත ලෙසින් පැහැදිලි කළ හැකි වුවද එය වැළඳ ගන්නට කිසිවෙකුට බල කරන්නට ඉස්ලාමය අනුමත නොකරයි. ඉස්ලාමීය රාජ්‍යයක වාසය කරන අන් ආගමික සුළුතරයකට වුවද එසේ බලකරන්නට කිසිදු අයිතියක් ඉස්ලාමීය රජයකට නොමැත. ආගමික විවිධත්වය ගැන ඉස්ලාමයේ මඟ පෙන්වීම එයයි.

## 02. ධර්මයේ බල කිරීමක් නැත.

ලොව පැවැති බොහෝ ගැටුම්කාරී අවස්ථාවන් නිරීක්ෂණය කරන විට විවිධ වූ ආගමික මත ගැටුම්වලට හේතුවක් වූ බව දැකගත හැකිවේ. එම නිසා ඉස්ලාමය මේ පිළිබඳව දරන මතය කුමක්ද යන්න විමසා බැලිය යුතුය. ඉස්ලාමය පිළිබඳව සමස්ථ මිනිස් වර්ගයා වෙත පැහැදිලි කරදීම මුස්ලිම්වරයකු සතු වගකීමක් වේ. ඒ සඳහා ඉතාමත් විනීත වූ ක්‍රමෝපායන් පමණක් භාවිතා කරන මෙන් අල්ලාහ් මුස්ලිම්වරුන් වෙත දන්වා සිටී.

"(නබිතුමනි!) ප්‍රඥාවෙන් යුතුව ද යහපත් උපදෙස් මඟින් ද නුඹගේ පරමාධිපතිගේ මාර්ගය වෙත ඇරයුම් කරනු. තවද ඔවුන් සමග ඉතා හොඳින් කරුණු සාකච්ඡා කරනු. ඔහු (අල්ලාහ්) ගේ මාර්ගයෙන් බැහැරවූවන් ගැන නියත වශයෙන් ම නුඹගේ පරමාධිපති මැනවින් දනී. තව ද යහමඟට ලක් වූ අය ගැනද ඔහු මැනවින් දනී" (අල්-කුර්ආන් 16-125)

ඉස්ලාමය පිළිබඳව සුමට වූත් තර්කානුකූල වූත් අයුරින් තවකෙකු වෙත පහදා දෙන ලෙස ද යමෙකු ඉස්ලාමය ප්‍රතික්ෂේප කළේ නම් ඔහු සමග සිරිත් පරිදිම සුහදශීලීව ඇසුරු කළ යුතු බවද ඉස්ලාමය පවසයි .

ඉස්ලාමීය රාජ්‍යයක් තුල ජීවත් වන මුස්ලිම් නොවන පුරවැසියන් හඳුන්වනු ලැබෙන්නේ දිම්මි යනුවෙනි. මෙහි අර්ථය "ආරක්ෂා කරගත යුතුයි" යන්නයි. එනම් ඔවුන් වෙත රැකවරණය හා ආරක්ෂාව ලබාදීම ඉස්ලාමීය රාජ්‍යය සතු වගකීමකි.

එසේම ඔවුන් වෙත ඉස්ලාමය වැළඳ ගැනීමට බල කිරීමට කිසිවකුට අයිතියක් නොමැත.

"දහම (අල්ලාහ් විසින් පහළ කරන ලද ජීවන පිළිවෙත පිළිපැදීමෙහි) බල කිරීමක් නොමැත" (අල් කුර්ආන් 2:256)

"නුඹගේ පරමාධිපතිට අභිමත වූයේ නම් මිහිතලය මත සිටිනා සියල්ලන්ම විශ්වාස වන්තයින් වන්නට ඉඩ තිබිණ. එබැවින් මිනිසුන් (සියල්ල) විශ්වාසවන්තයින් වන ලෙස නුඹ (මුහම්මද්



මේ අනුව බලන කල ලොව බහුතරයක් සිටින්නේ යහපත් මිනිසුන්ය. ඔවුන් සමග සාමයෙන් යුක්ති සහගතව කටයුතු කරමින් සුහදශීලීව වාසය කිරීම මුස්ලිම්වරුන්ගේ වගකීමකි.

## සහජීවනයේ ක්‍රමවේද

ඉවසීම හා සහජීවනය යනු ඉස්ලාමීය ඉතිහාසය පුරා දැකිය හැකි ලක්ෂණ වේ. අතීතයේ පටන්ම මුස්ලිම්වරුන් අන් අය සමග මිත්‍රශීලීව හා එක්ව වාසය කර ඇත. මේ සඳහා සාධක කිහිපයක් පහත දක්වා ඇත.

මදීනා නගරයේ ලොව පළමු ඉස්ලාමීය රජය පිහිටවූ අවස්ථාවෙහි එහි යුදෙව්වන්, කිතුනුවන් ඇතුලු මුස්ලිම් නොවන්නන් කිසිදු බියකින් තොරව ඔවුන්ගේ ආගම් අදහමින් සමාන අයිතිවාසිකම් සහිතව වාසය කිරීමේ නිදහස ඔවුන්ට සහතික කරන ලදී. පසුව මුස්ලිම්වරුන්ට අත්පත් වූ සෑම රාජ්‍යයකම මෙවැනි අන්‍ය ආගමිකයන් නිදහසේ නිරුපද්‍රිතව වාසය කළහ.

මක්කා නගරයෙහි මුස්ලිම්වරුන් හා අන් ආගමිකයන් අතර හුදෙයිබියා නමින් සටන් විරාම ගිවිසුමක් ඇති කරනු ලදුව ඔවුන් දෙපාර්ශවයම බියෙන් තොරව වාසය කළහ.

මදීනාවේ මුස්ලිම්වරුන් එහි වාසය කළ යුදෙව්, කිතුනු, බහු දේවාවදීන් සමඟ ගනුදෙනු කරමින් හා අසීරු ආපදා අවස්ථාවල එකිනෙකාට උදව් උපකාර කරමින් සුහදව වාසය කළහ.

මුස්ලිම්වරුන් හා අන් අයට තිබුණු ලේ ඥාතීන්ට ගරු කරන්නට කිසිදු බාධාවක් ඉස්ලාමය පනවා නැත.

නජරාන් වැනි විදේශ රටවල් ඇතුලු විවිධ රටවල පිරිස් සෑහෙන සංඛ්‍යාවක් මුහම්මද්තුමන් හමු වී සාකච්ඡා පැවැත් වූහ. ගිවිසුම්වලට අත්සන් තැබූහ. ඉස්ලාමීය වසර වන හිජ්රි 9 වැනි වසර දූතයන්ගේ වසර යැයි අමතන තරමට එම වසරෙහි විදේශ දූතයන් විශාල සංඛ්‍යාවක් මුහම්මද්තුමන් හමුවන්නට පැමිණියහ

"අල්ලාහ් නුඹට පෙන්වා දුන් දැයින් ජනයා අතර තීන්දු දීම පිණිස සැබැවින්ම අපි සත්‍යයෙන් යුත් පුස්තකය නුඹට පහළ කළෙමු. තවද වංචනිකයින් වෙනුවෙන් නුඹ මැදිහත් වන්නෙකු නොවනු" (අල් කුර්ආන් 4:105)

මුහම්මද් තුමන්ගේ සමීප ඥාතියෙකු වූ අලි පසු කලෙක කලීෆා (ජනාධිපති) බවට පත්විය. එවිට යමෙකු විසින් ඔහුගේ පළිහ සොරකම් කරන ලදී. පසුව එය මුස්ලිම් නොවන පුද්ගලයෙකුගේ සන්තකයේ තිබී සොයා ගන්නට හැකි විය. එසේ වුවද එම පළිහේ හිමිකාරත්වය සැකයෙන් තොරව අධිකරණයේ ඔප්පු කරන්නට ජනාධිපති අලි අපොහොසත් වූයෙන් අලි විසින්ම පත් කරනු ලැබ සිටි විනිසුරුවරයා එම නඩුව ඉවත දැමුවේය. ඉස්ලාමීය පාලනයේ තිබුණු යුක්තිය හා ජනාධිපතිවරයා විෂයෙහි වුවද නීතිය අනුව ක්‍රියා කරනු දැකීමෙන් අතිශයින් පැහැදුනු විත්තිකරු එම පළිහ සැබැවින්ම අලිගේ යැයි පිළිගෙන එය ඔහුට භාර දී ඉස්ලාමය වැළඳ ගත්තේය. යුක්තිය හා සාධාරණය යනු සාමයට හා සහජීවනයට ප්‍රධාන අවශ්‍යතාවන් වේ යන්න ඉස්ලාමයේ මග පෙන්වීමයි.

## 06. මානුෂීය සහය

පැහැදීමක් ඇති කිරීමේ ප්‍රධාන මගක් නම් යහ ගුණාංග හා මානුෂීය උපකාරයයි. අන් ආගමිකයන්ට උදව් උපකාර කිරීමට ඉස්ලාමය කිසිසේත් බාධා පනවන්නේ නැත. සැබැවින්ම දුගී බව, ලෙඩ රෝග වැනි හිරිහැරවලට ලක්ව සිටින්නන්ට උදව් කිරීම මුස්ලිම්වරුන්ගේ වගකීමක් මෙන්ම කුසල් ලැබෙන යහ ක්‍රියාවන් යැයි ඉස්ලාමය අවධාරණය කරයි.

"දහම හේතුවෙන් නුඹලා හා සටන් නොකළවුන් හටද නුඹලාව නුඹලාගේ නිවෙස් වලින් බැහැර නොකළවුන් හටද යහපත කිරීම හා යුක්ති ගරුකව කටයුතු කිරීම (පිළිබඳව) අල්ලාහ් නුඹලාව වළක්වන්නේ නැත. සැබැවින්ම අල්ලාහ් යුක්ති ගරුකව කටයුතු කරන්නන් ප්‍රිය කරන්නේය." (අල්-කුර්ආන් 60:8)



නබිවරයා) ඔවුන්ට බල කරන්නෙහි ද?" (අල්-කුර්ආන් 10:99)

"(නබිවරයා) නුඹ ඔවුන් කෙරෙහි බලපෑම් කරන්නෙකු නොවේ" (අල්-කුර්ආන් 88:22)

## 03. අන් ආගම් සංස්කෘති හා ශිෂ්ඨාචාරවලට ගරු කිරීම

අන් ආගමික ඇදහිලි හෝ ඒ වටා ගොඩනැගුනු සංස්කෘතීන් ඉස්ලාමයට පටහැනි වුවද ඒවා අවඥාවට ලක් කිරීමට මුස්ලිම්වරුන් වෙත ඉස්ලාමයෙන් කිසිදු අවසරයක් ලබා දී නොමැත. ඉස්ලාමය සැමවිටම තම සමාජයන් තුල සහජීවනය ගොඩනැංවීම උදෙසා සමාජය මෙහෙයවයි.

"(විශ්වසවන්තයිනි), අල්ලාහ් හැර කුමන දැයක් ඔවුන් අයදින්නේ ද එයට නුඹලා අපහාස නොකරනු." (6:108)

කෙනෙකු තමාගේ ආගම හෝ සංස්කෘතිය අන් අය විවේචනය නොකළ යුතුය යැයි අපේක්ෂා කරන්නේ නම් පළමුවෙන් ඔහු අන් අයගේ ආගම් සහ ඇදහිලි විවේචනය කිරීමෙන් වැළකී සිටිය යුතුය සර්ව ආගමික සංවාද යහපත් කරුණක් වුවද ඒවා අන් ආගම් විවේචනය කරන වේදිකා බවට පත් නොවිය යුතුය.

"තවද පුස්තකය (දෙවිඳුන් පහළ කළ දහම්) ලද ජනයා (කිතුනු හා යුදෙව්) සමග යහපත් අයුරින් මිස නුඹලා විවාද නොකරවු. (අල්-කුර්ආන් 29:46)

සතුරන් සමඟ සටන් කරන විට ඔවුන්ගේ ප්‍රදේශයේ තිබෙන ආගමික දේවස්ථානවලට හානි ඇති නොකළ යුතු යැයිද ආගමික නායකයන්ට ප්‍රහාර එල්ල නොකළ යුතු යැයිද ඉස්ලාමය අවධාරනය කරයි. ඉස්ලාමයේ ප්‍රතිපත්තිය වන්නේ 'මුස්ලිම්වරුන්ට තමන්ගේ ආගම, අන් අයට ඔවුනොවුන්ගේ ආගම යන්නයි

ස්පාඤ්ඤය, ඉන්දියාව වැනි රටවල් මුස්ලිම්වරුන්ගේ අණසකට යට වී වසර සිය ගණනක් ඔවුන් එම රටවල් පාලනය කළ සමයෙහි වුවද ඔවුන් එම රටවල සියල්ලන්වම බලය යොදවා ඉස්ලාම් ධර්මයට හරවන්නට කිසි විටෙක වෑයම් කළේ නැත. එපමණක් නොව අන්‍ය ආගමික ස්ථානවලට රාජ්‍ය අනුග්‍රහයෙන් ආරක්ෂාව දුන්නා මෙන්ම ඒවායේ නඩත්තුව සඳහාද ඉස්ලාමීය රජයන් දායක විය.

## 04. මිනිසාට ලැබුනු පොදු වේදිකාව

භාෂා, ආගම්, වර්ණ භේද පසෙකලා මිනිසුන්ට මිනිසුන් යන පොදු ලක්ෂණයට මුල් තැන දෙනමෙන් ඉස්ලාමය උගන්වයි. මිනිස් වර්ගයාගේ ප්‍රාරම්භය ආදම් සහ ඒවා යන එකම යුවලකි යැයිද ඉස්ලාමය අවධාරනය කරයි. ඒ අනුව ඔවුන් එකම සහෝදර දරු කැළකි.

මිනිසුනි! ඔබ සියල්ලන්වම එකම පුද්ගලයෙකුගෙන් නිර්මාණය කර එයින් නියමිත යුගලද මවා එදෙදෙන තුලින් බොහෝ පුරුෂයින් හා ස්ත්‍රීන්ද පතුරවා හැරෑ ඔබගේ දෙවියන්ට බිය බැති වන්න. (අල්-කුර්ආන් 4.1)

වර්තමානයෙහි සතුන්ට කරුණාව දක්වන මිනිසුන් ජාති ආගම් භාෂා භේද නිසා ඔවුනොවුන් අතර ඇන කොටා ගනිති. එනමුත් මිනිසුන් ස්වරූපයෙන් හා ලක්ෂණවලින් එක සමානය. රුධිරය එකම පාටය. වේදනාව හා සතුට ඔවුන්ට එක සමානව දැනේ. අවශ්‍යතාවන්ද එක හා සමානය. ඒ සියල්ල අභිබවා යමින් ඉස්ලාමය දෙසන්නේ ඔවුන් එකම මව්පිය යුවලකින් පැවතෙන සොහොයුරන් බවයි. ඉස්ලාමයට දැඩි සතුරුකම් කරමින් සිටි යුදෙව් මිනිසෙකුගේ මෘත දේහය ගෙන යනු දුටු මුහම්මද් තුමන් නැගිට එයට ගෞරවය දැක්වූහ. මෙය ගැන විමසූ විට 'ඔහුත් අප සේම මිනිසෙකු නොවේදැ'යි එතුමන් කීහ.



## 05. නීතිය සැමට සාධාරණ විය යුතුය

නීතිය ඉදිරියේ සියල්ලන්ම සමාන විය යුතුය. තම ආගමට ජාතියට අයත් වන්නා, එසේ නොවන්නා, මිතුරා, සතුරා, ඥාතියා, එසේ නොවන්නා, තමා හඳුනන්නා, නොහඳුනන්නා, තමාගේ භාෂාව කථා කරන්නා, වෙනත් භාෂාවක් කථා කරන්නා ආදී වශයෙන් කිසිදු වෙනසක් නොබලා යුක්තිය පසිඳලිය යුතුය. යුක්ති සහගත නොවීම සහජීවනය හා සාමය නැති වන්නට තුඩු දෙනු ඇත. මෙයට ලෝක ඉතිහාසය දෙස් දෙයි. ශුද්ධ කුර්ආනයේ දෙසුම වන්නේද මෙයමය.

“(විශ්වාසවන්තයිනි,)නීතිය අකුරටම පිළිපැදීමෙ හි අල්ලාහ් වෙනුවෙන් ඔබ සාක්ෂි දරනු. මිනිසුන් ගෙන් එක් කොටසක් කෙරෙහි (ඔබ තුළ ඇති) ද්වේෂය (ඔවුන්ට) අපරාධයක් කිරීමට ඔබව පොලඹවා නොගනිවූ. ඔබ යුක්තියම ක්‍රියාත්මක කරනු. එය බිය බැතිමත්භාවයට ඉතා සමීප වන්නේය. (කුමන අවස්තාවක දී වුවද) ඔබ අල්ලාහ්ටම බිය වනු. සැබැවින්ම අල්ලාහ් ඔබ කරන දෑ මැනවින් දනී.” (අල්-කුර්ආන් 5:8)

“විශ්වාසවන්තයිනි, යුක්තිය ඉටු කරන්නන් වනු. නුඹලා කෙරෙහි හෝ දෙමාපියන් හා ඥාතීන් කෙරෙහි හෝ එරෙහි වුව ද අල්ලාහ් වෙනුවෙන් සාක්ෂි දරන්නන් වනු. ඔහු ධනවත් වුව ද දිළිඳු වුව ද අල්ලාහ් ඔවුන් දෙදෙනාට (රැකවරණය ලබාදීමට) සුදුසු වන්නේය. නුඹලා තීන්දු දීමේ දී මනෝ ඉච්ඡාව අනුගමනය නොකරනු. (ඔබ සාක්ෂි දීමේ දී සාක්ෂිය) වෙනස් කළේ නම් හෝ (සත්‍යය ස්ථාපිත කිරීමට) පිටුපාන්නේ නම් හෝ එවිට අල්ලාහ් නුඹලා කරන දෑ පිළිබඳ අභිඥානවන්ත වන්නේය.” (අල්-කුර්ආන් 4:135)

මුහම්මද් තුමාගේ කාලයෙහි එක්තරා සොරකමක් විෂයයෙහි මුස්ලිම්වරයෙකු සම්බන්ධයෙන් මුස්ලිම් නොවන්නෙකු විසින් චෝදනා කරන ලදී. එය පිළිගැනීමට මුහම්මද්තුමන් මැලි වූහ. එවිට පහත ශුද්ධ අල්-කුර්ආන් වැකිය මුහම්මද් තුමන්ගේ එම මතය විෂයෙහි පහළ විය.